සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය - 2025 ජූලි

(301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2025-07-26
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
උත්තර ලිවීම සඳහා - පැය 03 යි.

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

A කොටස

(මුළු ලකුණු 20)

01 වන ප්‍රශ්නය

ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ, මූල්‍ය ප්‍රකාශන තුළ සපයනු ලබන මූල්‍ය තොරතුරු සඳහා මෙන්ම වෙනත් ආකාරවලින් සපයන මූල්‍ය තොරතුරු සඳහාද අදාල වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට (Conceptual Framework) අනුව මූලික ගුණාත්මක ලක්ෂණ දෙක(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය වැඩි කරනු ලබන ගුණාත්මක ලක්ෂණ (enhancing qualitative characteristics) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

02 වන ප්‍රශ්නය

සංකලිත වාර්තාවක (integrated report) මූලික වශයෙන් එකිනෙකට සම්බන්ධ වූ සහ අන්‍යෝන්‍ය වශයෙන් බැහැර නොවන මූලිකාංග අටක් ඇතුලත් වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

සංකලිත වාර්තාවක ඇතුලත් ප්‍රධාන මූලිකාංග පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

03 වන ප්‍රශ්නය

2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත අරුණි පොදු සමාගම** විසින් **සීමාසහිත සඳුනි පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 75% ක් රු.15,000,000/- කට අත්පත් කරගන්නා ලදි. අත්පත් කරගත් දිනට, **සීමාසහිත සඳුනි පොදු සමාගමේ** ශුද්ධ වත්කම්වල පොත් අගය පහත සඳහන් පරිදි විය:

	රු.('000)
ප්‍රකාශිත ප්‍රාග්ධනය	10,000
රඳවාගත් ඉපැයීම්	4,500

අත්පත් කරගත් දිනට, **සීමාසහිත සඳුනි පොදු සමාගමේ** ශුද්ධ වත්කම්වල සාධාරණ අගය රු.16,000,000/- ක් විය. ධාරණ අගය සහ සාධාරණ අගය අතර වෙනසට හේතු වූයේ ඉඩම් ප්‍රත්‍යාගණනයයි. එදිනට, පාලනය නොවන හිමිකමෙහි සාධාරණ අගය රු.4,500,000/- ක් විය.

ඔබ විසින් කළ යුතු දෑ:

අත්පත් කරගැනීම මත ඇති වූ කීර්තිනාමය (goodwill) **ගණනය කරන්න.** (ලකුණු 05)

04 වන ප්‍රශ්නය

(a) දේපළ, පිරියත සහ උපකරණ යනු, නිෂ්පාදනයේදී හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා භාවිත කිරීමට හෝ අන් අයට කුලියට දීම සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා තබා ඇති ස්පෘශ්‍ය (tangible) අයිතම වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැය, වත්කමක් ලෙස හඳුනාගැනීම සඳහා සපුරාලිය යුතු නිර්ණායක දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයතනයක් [Small and Medium Sized Enterprise (SME)] ලෙස සැලකෙන **සීමාසහිත සිල්වා (පෞද්ගලික) සමාගම,** 2020 දී සිය මෙහෙයුම් ආරම්භ කරන ලදි. සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා වන **සිල්වා,** පහත සඳහන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා මූල්‍ය උපදේශකයෙකු වෙත යොමු වී ඇත:

(1) සමාගම, තොග අගය කිරීමේ ක්‍රමය, බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමයේ [Weighted Average Cost Method (WAC)] සිට පළමු ලැබීම් පළමු නිකුත් කිරීමේ ක්‍රමයට [First-In-First-Out (FIFO)] වෙනස් කිරීමට බලාපොරොත්තු වේ.

(2) තොගයේ පිරිවැය රු.250,000/- ක් වූ අතර, එහි ශුද්ධ උපලබ්ධි වටිනාකම රු.275,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත එක් එක් කරුණ, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS for SMEs) අනුව, **සීමාසහිත සිල්වා (පෞද්ගලික) සමාගමේ** ගිණුම් පොත්වල සළකා බැලිය යුත්තේ කෙසේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 30)

05 වන ප්‍රශ්නය

සීමාසහිත Chemiro (පෞද්ගලික) සමාගමේ 2025 මාර්තු 31 දිනට සහ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

සීමාසහිත Chemiro (පෞද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

මාර්තු 31 දිනට	2025	2024
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ	220,400	156,930
සමුච්චිත ක්ෂය	(129,100)	(101,460)
ධාරණ අගය	**91,300**	**55,470**
ජංගම වත්කම්:		
තොග	106,420	157,439
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	110,426	97,830
මුදල් සහ මුදල්වලට සමාන දෑ	15,400	8,900
	232,246	**264,169**
මුළු වත්කම්	**323,546**	**319,639**
ස්කන්ධය සහ වගකීම්:		
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 12,800,000)	128,000	128,000
රඳවාගත් ඉපැයීම්	125,596	114,939
	253,596	**242,939**
ජංගම නොවන වගකීම්:		
බැංකු ණය	30,400	31,400
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම)	21,480	26,700
	51,880	**58,100**
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	5,400	420
බැංකු ණය	2,000	11,500
ගෙවිය යුතු ණය පොලිය	7,430	1,040
ගෙවිය යුතු ආදායම් බදු	3,240	5,640
	18,070	**18,600**
මුළු ස්කන්ධය සහ වගකීම්	**323,546**	**319,639**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ආදායම් බදු වියදම රු.3,400,000/- කි. සමාගමේ පොළී සහ බදු පෙර ලාභය රු.23,437,000/- ක් වූ අතර සාමාන්‍ය කොටස්කරුවන් සඳහා අතුරු ලාභාංශ 2024 දෙසැම්බර් 31 දින ගෙවා ඇත.

(2) 2024 ඔක්තෝම්බර් 01 දින, යන්ත්‍රයක් රු. මිලියන රු. 9.5 කට විකුණන ලදී. යන්ත්‍රයේ පිරිවැය රු. මිලියන 15 ක් වූ අතර, 2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය රු. මිලියන 7.5 ක් විය. යන්ත්‍ර පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට වසර 10 ක් පුරා ක්ෂය කරනු ලබයි. එම විකුණූ යන්ත්‍රයට ප්‍රතිස්ථාපනයක් වශයෙන්, 2025 මාර්තු 31 දින නව යන්ත්‍රයක් මිලට ගත් අතර, එය එදිනම ප්‍රාග්ධනීත කරන ලදී.

(3) වර්ෂය සඳහා වන පොලී වියදම රු.8,100,000/- ක් වන අතර, වර්ෂය තුළදී සමාගම විසින් රු.10,000,000/- ක නව බැංකු ණය මුදලක් ලබාගන්නා ලදී.

(4) වර්ෂය සඳහා වන පාරිතෝෂික වෙන්කිරීම රු.1,750,000/- ක් වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Chemiro (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, <u>වක්‍ර ක්‍රමය යටතේ</u> **පිළියෙල කරන්න**.

(ලකුණු 10)

06 වන ප්‍රශ්නය

(a) වායු සමීකරණ විකිණීමේ හා නඩත්තු සේවා සැපයීමේ සමාගමක් වන, **සීමාසහිත ABC සමාගමෙන්** පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

සීමාසහිත ABC සමාගම, රු.22,000/- ක මාසික ගාස්තුවකට වසර දෙකක් සඳහා වායු සමීකරණ යන්ත්‍රයක් නඩත්තු සේවා සහිතව විකිණීමට **සීමාසහිත Ranga සමාගම** සමඟ 2024 අප්‍රේල් 01 දින ගිවිසුමකට එළඹ ඇත. මෙය වෙන වෙනම විකුණන්නේ නම්, වායු සමීකරණ යන්ත්‍රයේ වෙළෙඳපොළ වටිනාකම රු.360,000/- ක් වන අතර, නඩත්තු සේවාව සඳහා මාසික ගාස්තුව රු.8,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) 15 - ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය අනුව, 2025 මාර්තු 31 දිනෙන් සහ 2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා ඉහත ගනුදෙනුවෙන් ඇති වන අයභාරය **හඳුනා දක්වන්න.**

(ලකුණු 04)

(b) 2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත Lak සමාගම** (කල්බදු ගැනුම්කරු) නව යන්ත්‍රයක් මිලට ගැනීම සඳහා **සීමාසහිත XYZ Finance සමාගම** (කල්බදු දීමනාකරු) සමඟ කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. කල් බදු ගිවිසුම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබ වෙත දී ඇත:

යන්ත්‍රයේ පිරිවැය	රු.7,000,000/-
කල්බද්ද ආරම්භයේදී සිදු කළ මූලික ගෙවීම	රු.1,000,000/-
කල්බදු කාල සීමාව	වර්ෂ 4
ව්‍යංග පොලී අනුපාතය	වාර්ෂිකව 14%
වාර්ෂික කල්බදු වාරිකය	රු.2,059,229/-

පළමු වාර්ෂික කල්බදු වාරිකය, 2025 මාර්තු 31 දින ගෙවූ අතර, කල්බදු ගිවිසුම අනුව, කල්බදු කාලසීමාව අවසානයේදී යන්ත්‍රයේ හිමිකම **සීමාසහිත Lak සමාගම** වෙත මාරුවේ. සමාගම විසින් වත්කම භාවිත කිරීමේ හිමිකම, වත්කමේ කල්බදු කාල සීමාව පුරා සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත කල්බදු ගනුදෙනුව සම්බන්ධයෙන්, **සීමාසහිත Lak සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සහ 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන් **පිළියෙල කරන්න.**

(ලකුණු 06)

(මුළු ලකුණු 10)

07 වන ප්‍රශ්නය

(A) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Salma සමාගමේ** මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2025 ජූනි 30 දින අනුමැතිය ලබාදෙන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සලකා නොබලන ලද පහත සිදුවීම් වාර්තා කරන කාල පරිච්ඡේදයෙන් පසුව සිදුව ඇති බව මූල්‍ය කළමනාකරුට පසුව අවබෝධ විය:

(1) සමාගමේ මූල්‍ය ගණකාධිකාරීවරයා සහ ගබඩා කළමනාකරු එක්ව සිදුකරන ලද තොගවලට අදාල වංචාවක් 2025 ජූනි 15 දින අනාවරණය විය. මෙම වංචාව නිසා සිදුවූ අලාභය රු. මිලියන 30 ක් ලෙස ඇස්තමේන්තු ගතකර ඇති අතර, මේ හේතුවෙන් 2025 මාර්තු 31 දිනට පැවති තොගයේ වටිනාකම, මෙම අගයෙන් වැඩියෙන් (overstated) සටහන් වී තිබුණි.

(2) වෙළෙඳපොළ බිඳ වැටීම හේතුකොටගෙන 2025 අප්‍රේල් 10 දිනට සමාගමේ කෙටිකාලීන ආයෝජනවල වටිනාකම රු.500,000/- කින් අඩුවී ඇත.

(3) 2025 අප්‍රේල් 10 දින පැවති රැස්වීමේදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ලාභයෙන්, සාමාන්‍ය කොටස්හිමියන්ට කොටසකට රු.2/- බැගින් වූ අවසාන ලාභාංශයක් අනුමත කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 10 - වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් ප්‍රමිතය අනුව, ඉහත එක් එක් සිදුවීම්, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Salma සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නේ කෙසේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(B) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Beta සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

	රු.('000)
2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු පෙර ලාභය	12,400
2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු අයකළ හැකි ලාභය	20,000
2024 අප්‍රේල් 01 දිනට විලම්භිත බදු වගකීම	3,500

දේපළ පිරියත සහ උපකරණවල විස්තර පහත පරිදි වේ: *(රු.'000)*

වත්කම්	**පිරිවැය**	**2025 මාර්තු 31 දිනට ධාරණ අගය (ගිණුම්කරණ ලියා හළ අගය)**	**2025 මාර්තු 31 දිනට බදු අරමුණු අනුව සමුච්චිත ක්ෂය වීම (ප්‍රාග්ධන දීමනාව)**
ඉඩම	10,000	10,000	-
ගොඩනැගිලි	54,000	38,500	22,500

සමාගමට අදාල ආදායම් බදු අනුපාතය 30% කි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) 2025 මාර්තු 31 දිනට විලම්භිත බදු වත්කම / වගකීම **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු වියදම **ගණනය කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 50)

08 වන ප්‍රශ්නය

සීමාසහිත Zigma පොදු සමාගමේ ගිණුම් පොත්වලින් 2025 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

සීමාසහිත Zigma පොදු සමාගම

2025 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම *(රු.'000)*

	හර	බැර
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 50,000,000)		50,000
2024 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම්		8,400
ප්‍රත්‍යාගණන අතිරික්තය		3,000
දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට:		
ඉඩම - ප්‍රත්‍යාගණිත අගයට (පිරිවැය - රු.25,000,000/-)	28,000	
ගොඩනැගිලි	23,000	
මෝටර් වාහන	14,000	
2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:		
ගොඩනැගිලි		13,500
මෝටර් වාහන		6,500
වත්කම් ඉවත් කිරීමේ ගිණුම		5,000
ප්‍රාග්ධන නොනිමි වැඩ	14,550	
2025 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට	63,000	
වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල්	41,000	20,725
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	55,525	
බැංකු ණය		6,000
ගෙවූ ආදායම් බදු	6,500	
විකුණුම් පිරිවැය / විකුණුම්	151,200	354,000
වෙනත් ආදායම්		8,100
2024 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු		4,500
පරිපාලන වියදම්	39,750	
බෙදාහැරීමේ වියදම්	28,700	
මූල්‍ය වියදම්	14,500	
	479,725	**479,725**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 අප්‍රේල් 01 දින, සමාගම සතුව තිබූ මෝටර් රථයක් රු. මිලියන 5 කට විකුණන ලදී. මෙම මෝටර් රථයේ පිරිවැය රු. මිලියන 6 ක් වූ අතර, විකුණන දිනට සමුච්චිත ක්ෂය වෙන් කිරීම රු. මිලියන 1.5 ක් විය. මෝටර් රථය විකිණීමෙන් ලද මුදල, වත්කම් ඉවත්කිරීමේ ගිණුමට බැරකොට ඇත. මුදල් ලැබීම වාර්තා කිරීම හැරුණු විට, වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(2) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

ගොඩනැගිලි	:	වර්ෂ 50
මෝටර් වාහන	:	වර්ෂ 05

(3) 2024 අප්‍රේල් 01 දින, සමාගම ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 10% ක වාර්ෂික පොළී අනුපාතිකයක් යටතේ රු.6,000,000/- ක බැංකු ණයක් ලබාගෙන ඇත. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2024 අප්‍රේල් 01 දින ආරම්භ කළ අතර, 2024 දෙසැම්බර් 31 දින අවසන් කරන ලදී. මෙම ගොඩනැගිල්ල, 2025 ජනවාරි 01 දින සිට මෙහෙයුම් සඳහා භාවිතයට ගන්නා ලදී. ඉදිකිරීම් කටයුතු සඳහා දරණ ලද පිරිවැය, ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුමේ වාර්තාකර ඇති අතර, වර්ෂයට අදාල ණය පොලිය, මූල්‍ය වියදම් යටතේ වාර්තා කර ඇත. මෙම ණය මුදලේ ප්‍රාග්ධන ආපසු ගෙවීම්, 2025 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලද අතර, ණය මුදලෙන් ¼ ක් ඊළඟ මූල්‍ය වර්ෂයේ (2025/26) පියවිය යුතුය.

(4) සමාගමේ ප්‍රතිපත්තියට අනුව, සෑම වර්ෂ 2 කට වරක්ම ඉඩම ප්‍රත්‍යාගණනය කරනු ලබයි. ඒ අනුව, 2025 මාර්තු 31 දින ඉඩම රු.30,000,000/- කට නැවත අගය කරන ලදී. නමුත්, මේ පිළිබඳව ගිණුම් පොත්වල සටහන් තබා නොමැත.

(5) ව්‍යාපාරයට, රු.1,500,000/- ක මුදලක් ලැබිය යුතුව තිබූ ණයගැතියෙකු, 2025 මැයි 25 දින බුන්වත්භාවයට පත්ව ඇති බව ප්‍රකාශ කරන ලදී. මේ වන විට මෙම මුදල් ලබාගත නොහැකි බවට තහවුරු වී ඇති අතර, බොල් ණයක් ලෙස ලියාහැරිය යුතු වේ. මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු ප්‍රතිපාදනයක් සිදුකොට නොමැත. තවද, 2025 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට තීරණය විය.

(6) 2023/2024 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම රු.4,500,000/- ක් වූ අතර, එය 2024/25 තක්සේරු වර්ෂය තුළදී ගෙවා ඇති අතර, ගෙවූ ආදායම් බදු ගිණුමේ සටහන් කර ඇත. 2024/2025 තක්සේරු වර්ෂයේ ආදායම් බදු වගකීම, රු.9,750,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(7) වංචාවක් නිසා සමාගමෙන් ඉවත් කරනු ලැබූ හිටපු සේවකයෙක් රු.2,000,000/- ක වන්දියක් ඉල්ලා සමාගමට විරුද්ධව නඩුවක් 2025 මාර්තු 15 දින, පවරා ඇත. සාක්ෂි නොමැති වීම හේතුකොට ගෙන, මෙම සම්පූර්ණ මුදලම වන්දියක් ලෙස ගෙවීමට ඉහළ සම්භාවිතාවයක් ඇති බව සමාගමේ නීතිඥවරුන් තහවුරු කර ඇත. මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොමැත.

(8) 2024/25 වර්ෂය සඳහා උපචිත විගණන ගාස්තු වශයෙන් රු.150,000/- ක් ගිණුම් පොත්වල සටහන් කළ යුතුය.

(9) 2025 මැයි 31 දින, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත Zigma පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 07)

(c) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

09 වන ප්‍රශ්නය

2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත Vikash පොදු සමාගම** විසින් **සීමාසහිත Prakash පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 90% ක් රු. මිලියන 105 කට අත්පත් කරගන්නා ලදී. අත්පත් කරගැනීමෙන් ඇතිවූ කීර්තිනාමය රු. මිලියන 17 කි.

සීමාසහිත Vikash පොදු සමාගමේ සහ **සීමාසහිත Prakash පොදු සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන විස්තීර්ණ ආදායම් ප්‍රකාශන පහත සඳහන් පරිදි විය:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශන *(රු.'000)*

	සීමාසහිත Vikash පොදු සමාගම	**සීමාසහිත Prakash පොදු සමාගම**
විකුණුම්	1,035,200	624,000
විකුණුම් පිරිවැය	(703,900)	(443,000)
දළ ලාභය	**331,300**	**181,000**
වෙනත් ආදායම්:		
වෙනත් ආදායම්	3,600	900
වත්කම් ඉවත් කිරීමේ ලාභ	200	620
වියදම්:		
බෙදාහැරීමේ වියදම්	(64,000)	(34,000)
පරිපාලන වියදම්	(116,000)	(67,000)
මූල්‍ය වියදම්	(18,500)	(23,400)
බදු පෙර ලාභය	**136,600**	**58,120**
ආදායම් බදු	(40,980)	(16,564)
වර්ෂය සඳහා ලාභය	**95,620**	**41,556**
වෙනත් විස්තීර්ණ ආදායම	355	-
මුළු විස්තීර්ණ ආදායම	**95,975**	**41,556**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී, **සීමාසහිත Vikash පොදු සමාගම** විසින් රු.60,000,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් සහිතව **සීමාසහිත Prakash පොදු සමාගමට** විකුණන ලදී. 2025 මාර්තු 31 දිනට, **සීමාසහිත Prakash පොදු සමාගමේ** ගබඩාව තුළ **සීමාසහිත Vikash පොදු සමාගමෙන්** මිලට ගත් භාණ්ඩවලින් රු.5,000,000/- ක් වටිනා තොගයක් නොවිකිණී ඉතිරිව ඇත.

(2) **සීමාසහිත Vikash පොදු සමාගමේ** වෙනත් ආදායම් තුළ **සීමාසහිත Prakash පොදු සමාගමට** සැපයූ උපදේශන සේවා සඳහා එම සමාගම විසින් ගෙවන ලද රු.3,000,000/- ක කළමනාකරණ ගාස්තු ඇතුළත් වේ.

(3) 2024 ඔක්තෝම්බර් 01 දින, **සීමාසහිත Prakash පොදු සමාගම** 10% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ රු.2,000,000/- ක ණය මුදලක් **සීමාසහිත Vikash පොදු සමාගමෙන්** ලබාගෙන ඇත. **සීමාසහිත Prakash පොදු සමාගම** විසින් 2024/25 වර්ෂ සඳහා වන පොලිය, **සීමාසහිත Vikash පොදු සමාගම** වෙත සම්පූර්ණයෙන්ම ගෙවා ඇත.

(4) 2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත Prakash පොදු සමාගම** විසින් එදිනට එහි ගිණුම් පොත්වල ධාරණ අගය රු.9,500,000/- ක් වන යන්ත්‍රයක් රු.10,000,000/- ක මිලකට, **සීමාසහිත Vikash පොදු සමාගමට** විකුණන ලදී. 2024 අප්‍රේල් 01 දිනට, එම යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 කි.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න.** (ලකුණු 10)

10 වන ප්‍රශ්නය

සීමාසහිත Rex පොදු සමාගමේ 2025 මාර්තු 31 දිනෙන් සහ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන් 2025 මාර්තු 31 දිනට සහ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන් පහත පරිදි වේ:

සීමාසහිත Rex පොදු සමාගම
ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන් *(රු.'000)*

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා	**2025**	**2024**
විකුණුම්	410,000	320,000
විකුණුම් පිරිවැය	(264,000)	(212,500)
දළ ලාභය	**146,000**	**107,500**
පොලී සහ බදු පෙර ලාභය	71,600	37,600
පොලී වියදම	(9,737)	(9,100)
බදු පෙර ලාභය	61,863	28,500
බදු පසු ලාභය	**42,884**	**20,093**

සීමාසහිත Rex පොදු සමාගම
මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

මාර්තු 31 දිනට	**2025**	**2024**
වත්කම්:		
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට	320,000	280,000
ජංගම වත්කම්:		
තොග	82,000	75,000
වෙළෙඳ ලැබිය යුතු මුදල්	54,000	42,000
මුදල් සහ මුදල්වලට සමාන දෑ	12,000	9,000
	148,000	126,000
මුළු වත්කම්	**468,000**	**406,000**
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් මිලියන 20)	200,000	200,000
රඳවාගත් ඉපැයීම්	79,400	55,500
දිගුකාලීන වගකීම්:		
දිගු කාලීන ණය	110,000	80,000
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	61,500	55,000
ගෙවිය යුතු ආදායම් බදු	9,600	6,500
උපචිත වියදම්	7,500	9,000
	78,600	70,500
මුළු ස්කන්ධය සහ වගකීම්	**468,000**	**406,000**

පහත සඳහන් අතිරේක තොරතුරු සලකා බලන්න:

(1) 2023 මාර්තු 31 දිනට, වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ තොගය පිළිවෙලින් රු.32,000,000/- ක් සහ රු.20,000,000/- ක් විය.

(2) සියලුම විකුණුම් සහ ගැනුම් ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, **සීමාසහිත Rex පොදු සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් සහ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා / අවසන් දිනට පහත සඳහන් අනුපාතයන් **ගණනය කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ශුද්ධ ලාභ අනුපාතය.

(iii) ණයගැති එකතුකිරීමේ කාලය.

(iv) තොග රඳවා ගැනීමේ කාලය.

(v) කොටසක ඉපැයුම. (ලකුණු 10)

(b) ඉහත වර්ෂ දෙක සමඟ සංසන්දනය කරමින්, වියහැකි විචලනයන්ට විය හැකි හේතුද සමඟින් **සීමාසහිත Rex පොදු සමාගමේ** කළමනාකාරීත්වයට සාරාංශ වාර්තාවක් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
දැනුම (1)	තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම	අඳින්න	හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම.
		සම්බන්ධ කරන්න	තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම.
		සඳහන් කරන්න	ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.
		හඳුනා දක්වන්න	සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම.
		ලැයිස්තුගත කරන්න	විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
අවබෝධය (2)	අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම.	හඳුනාගන්න	අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම.
		අර්ථකතනය කරන්න	වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න.
		විස්තර කරන්න	ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න.
		පැහැදිලි කරන්න	අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම.
		නිර්වචනය කරන්න	ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
භාවිතය (3)	අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම.	සසඳන්න	තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න.
		ප්‍රස්තාර දක්වන්න	ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න.
		තක්සේරු කරන්න	වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න.
		විසඳන්න	ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම.
		පිළියෙල කරන්න	විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම.
		ප්‍රදර්ශනය කරන්න	උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම.
		ගණනය කරන්න	ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම.
		භාවිත කරන්න	ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
විශ්ලේෂණය (4)	අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම.	සන්නිවේදනය කරන්න	තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම.
		සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.
		අසමානතා බලන්න	අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම.
		සමානකම් බලන්න	සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම.
		විමසන්න	තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම.
		වෙනස්කොට දක්වන්න	යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම.
		විශ්ලේෂණය කරන්න	විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න.